(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **97.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 දෙසැම්බර් 10 ඉරිදා පූ.භා. 9.30 ට**

# පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **නීතිඥ සාගර කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු **උදයන කිරිඳිගොඩ මහතා**

ගරු **ගෙවිඳු කුමාරතුංග මහතා**

ගරු **කේ. පී. එස්. කුමාරසිරි මහතා**

ගරු **කරුණාදාස කොඩිතුවක්කු මහතා**

ගරු **උදය ගම්මන්පිල මහතා**

ගරු **උදයකාන්ත ගුණතිලක මහතා**

ගරු **යදාමිණී ගුණවර්ධන මහතා**

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා**

ගරු  දයාසිරි ජයසේකර මහතා

ගරු  එම්. එස්. තවුෆික් මහතා

ගරු  ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු  (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු  අනුර දිසානායක මහතා

ගරු  මයන්ත දිසානායක මහතා

ගරු  නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු  සූ. නෝගරාදලිංගම් මහතා

ගරු  (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු  ඩිලාන් පෙරේරා මහතා

ගරු  ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු  (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු  සුදත් මංජුල මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  මොහමඩ් මුසම්මිල් මහතා

ගරු  කුමාරසිරි රත්නායක මහතා

ගරු  සී. බී. රත්නායක මහතා

ගරු  ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු  (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු  උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු  නිමල් ලාන්සා මහතා

ගරු  ගාමිණී ලොකුගේ මහතා

ගරු  ගාමිණී වලේබොඩ මහතා

ගරු  ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු  රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු  එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු  නීතිඥ මධුර විතානගේ මහතා

ගරු  විමල් වීරවංශ මහතා

ගරු  වීරසුමන වීරසිංහ මහතා

ගරු  (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු  දිලිප් වෙදආරච්චි මහතා

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:—** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

" 'ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ)' පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් ම'විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සමන්ප්‍රිය හේරත් මහතා"

II

" 'රුහුණු උද්‍යානය සංවිධානය (සංස්ථාගත කිරීමේ)' පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු රෝහණ දිසානායක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා"

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාවට යොමු කරන ලද —

(i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයන් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික තීරණය කිරීම සඳහා වන යෝජනා සම්මතය;

(ii) මුදල් පනත් කෙටුම්පත; සහ

(iii) ආහාර පාන හා නිල ඇඳුම් වැය විෂයයෙහි හිඟ බිල්පත් පියවීම සඳහා වන පරිපූරක ඇස්තමේන්තුව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 3 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2023 දෙසැම්බර් 11 සඳුදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත:—** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ.භා. 11.06ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

එකල්හි ගණපූරණයක් නොමැති බවට මූලාසනයේ සැලකිල්ල යොමු කරන ලදින් පාර්ලිමේන්තුව ගණන් කරන ලදී. එවිටද ගණපූරණයක් නොසිටියෙන් පාර්ලිමේන්තුවේ 11 වැනි ස්ථාවර නියෝගය යටතේ අ. භා. 12.05 ට නියෝජ්‍ය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව කල්තබන ලදී.

එතැන් සිට විවාදය වෙනත් දිනයක පවත්වනු ලැබේ.

**6. මුදල් පනත් කෙටුම්පත:—** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි ගණපූරණයක් නොමැති බවට මූලාසනයේ සැලකිල්ල යොමු කරන ලදින් පාර්ලිමේන්තුව ගණන් කරන ලදී. එවිටද ගණපූරණයක් නොසිටියෙන් පාර්ලිමේන්තුවේ 11 වැනි ස්ථාවර නියෝගය යටතේ අ. භා. 12.05 ට නියෝජ්‍ය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව කල්තබන ලදී.

එතැන් සිට විවාදය වෙනත් දිනයක පවත්වනු ලැබේ.

**7. පරිපූරක මුදල,— ශීර්ෂය 222 —** වැඩසටහන **01 — † :** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2023 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් දහසය බිලියන පන්සිය මිලියනයක් (රු. 16,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළයුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

**ශීර්ෂය 222** - ශ්‍රී ලංකා යුධ හමුදාව

වැඩසටහන **01 -** මෙහෙයුම් වැඩසටහන

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 16,500,000,000 |
| **මුළු වියදම** | **රු. 16,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2023 දෙසැම්බර් 01 දින ඉදිරිපත් කරන ලද 2023 අංක 3 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 හා 2 හි එකතුව රු. 251,500,000,000.

එකල්හි ගණපූරණයක් නොමැති බවට මූලාසනයේ සැලකිල්ල යොමු කරන ලදින් පාර්ලිමේන්තුව ගණන් කරන ලදී. එවිටද ගණපූරණයක් නොසිටියෙන් පාර්ලිමේන්තුවේ 11 වැනි ස්ථාවර නියෝගය යටතේ අ. භා. 12.05 ට නියෝජ්‍ය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව කල්තබන ලදී.

එතැන් සිට විවාදය වෙනත් දිනයක පවත්වනු ලැබේ.

**8. ගණපූරණය නොමැතිවීම :** එකල්හි ගණපූරණයක් නොමැති බවට මූලාසනයේ සැලකිල්ල යොමු කරන ලදින් පාර්ලිමේන්තුව ගණන් කරන ලදී. එවිටද ගණපූරණයක් නොසිටියෙන්, නියෝජ්‍ය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවේ 11 වැනි ස්ථාවර නියෝගය යටතේ අ. භා. 12.05 ට ප්‍රශ්නය නොවිමසා, 2023 දෙසැම්බර් 11 සඳුදා පූ. භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල්තබන ලදී.